# ඉන්ධන සුරක්ෂිතභාවය

පෙට්‍රල්, ඩීසල් සහ අනෙකුත් ඉන්ධන සම්බන්ධයෙන් ආරක්ෂිතව සිටීම.

## ඉන්ධන සම්බන්ධයෙන් ආරක්ෂිතව සිටීම

පෙට්‍රල්, ඩීසල් සහ අනෙකුත් ඉන්ධන අධික ලෙස ගිනි ගන්නා සුළු වන අතර ඒවා වැරදි ලෙස හැසිරවුවහොත්, එමගින් පුද්ගලයින්ට, දේපළවලට සහ පරිසරයට බරපතල අවදානම් ඇති කළ හැකිය.

## ඉන්ධන ආරක්ෂිතව ගබඩා කිරීම

අනුමත ලකුණක් සහිතව අනුමත කරන ලද පෙට්‍රල් හෝ ඩීසල් බහාලුම්වල පමණක් ඉන්ධන ගබඩා කරන්න. ඉන්ධන හා සේවා සැපයුම්හල්වලින් පුරවන ලද අතේ ගෙන යා හැකි බහාලුම් ලීටර් 25 නොඉක්මවිය යුතු බව WorkSafe නිර්දේශ කරයි.

ඉන්ධන සිසිල්, හොඳින් වාතාශ්‍රය ඇති ප්‍රදේශයක ගබඩා කරන්න. වඩාත් මනාප වන්නේ නිවස තුළ නොව වෙන්ව පිහිටි මඩුවක හෝ ගරාජයක ගබඩා කිරීමය.

ඉන්ධන ආරක්ෂිතව ගබඩා කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා, WorkSafe වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

## ඉන්ධන ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම

ඉන්ධන ප්‍රවාහනය කරන්නේ ඔබගේ තණකොළ කපන යන්ත්‍රය හෝ ජෙනරේටරය වැනි නිවසේ භාවිතය සඳහා නම්, පෙරළීම හෝ චලනය වීම වැළැක්වීම සඳහා එය මුද්‍රා තබන ලද, සිරස්ව තබා ඇති අනුකූලවන බහාලුමක තිබිය යුතුය.

වාහනයක මගීන් අසුන් ගන්නා ප්‍රදේශය තුළ ඉන්ධන ප්‍රවාහනය නොකරන්න. එමෙන්ම බහාලුම් උණුසුම් හෝ සංවෘත අවකාශයන්හි දිගු වේලාවක් තැබීමෙන් වළකින්න.

ඉන්ධන ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම පිළිබඳ වැඩි විස්තර සඳහා, WorkSafe වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.

## ඉන්ධන ආරක්ෂිතව බැහැර කිරීම

ඉන්ධන දිගු කාලයක් ගබඩාකර තැබීම නොකළ යුතුය. කාලයත් සමග ඉන්ධනවල ගුණාත්මකභාවය පිරිහෙන අතර ඒවා අනාරක්ෂිත හෝ භාවිතයට නුසුදුසු විය හැකිය.

ඉන්ධන කාණු වලට, බිමට හෝ ගෘහස්ථ කුණු බඳුන්වලට මුදා හැරීම කිසිවිටෙකත් සිදු නොකරන්න. පැරණි හෝ අඩු ගුණාත්මක බවකින් යුත් ඉන්ධන 'Detox Your Home' වැනි අනුමත කරන ලද බැහැර කිරීමේ සේවාවක් හරහා ආරක්ෂිතව බැහැර කළ යුතුය.

## ඉන්ධන හසුරවන විට පුද්ගලික ආරක්ෂාව

හොඳින් -වාතාශ්‍රය ඇති ප්‍රදේශවලදී ඉන්ධන හසුරුවන්න. එමෙන්ම දුමාරය ආශ්වාස කිරීමෙන් වළකින්න.

ඉන්ධන නැවත සැපයීමේදී හෝ ඉන්ධන වෙනත් තැනකට ගෙන යෑමේදී, අවශ්‍ය වන අවස්ථාවලදී අත්වැසුම් හෝ ඇස් ආවරණ වැනි සුදුසු ආරක්ෂක උපකරණ භාවිතා කරන ලෙසත්, ඉන් පසුව දෑත් හොඳින් සෝදා ගන්නා ලෙසත් WorkSafe යෝජනා කරයි.

ඉන්ධන ආරක්ෂිතව හැසිරවීම පිළිබඳ වැඩි විස්තර සඳහා, WorkSafe වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.